www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පකිස්තානය: ත්‍රස්තවාදී ප්‍රහාරය ජාත්‍යන්තර ක්‍රිකට් තරගය ඉලක්ක කර ගනී

## Pakistan: Terrorist attack targets international cricket match

**කීත් ජෝන්ස් විසිනි**
**2009 මාර්තු 4**

ලාහෝර්හි පැවැත්වෙන පකිස්තාන-ශ්‍රී ලංකා ක්‍රිකට් තරගයක් සඳහා ක්‍රීඩකයන් හා විනිසුරුවරුන් රැගෙන යන රථ පේලියකට අඟහරුවාදා උදයේ නාඳුනන ත්‍රස්තවාදීන් පිරිසක් කොමාන්ඩෝ ශෛලියේ කඩාපනින ප්‍රහාරයක් එල්ල කිරීමෙන්, අට දෙනෙක් ඝාතනයට ලක්ව දුසිමකට වඩා තුවාල ලැබීය.

ප්‍රවෘත්ති වාර්තාවලට අනුව, ශ්‍රී ලංකා ක්‍රිකට් කන්ඩායම රැගත් බස් රථය පකිස්තානයේ දෙවන විශාලතම නගරයේ මැද පිහිටි ප්‍රධාන මංසන්ධියක් වෙත සේන්දු වූ විට, ප්‍රහාරක රයිෆල්, ග්‍රෙනේඩ් හා රොකට් විදිනයකින් සන්නද්ධ, දුසිමක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක තරුන පිරිසක්, එම බස් රථය තුන් පැත්තකින් වටකොට පහර දුන්හ.

බස් රථයට ආරක්ෂාව සපයමින් ගමන් කරමින් සිටි පොලිස් භටයන් පෙරලා වෙඩි තැබූ අතර, ඉන් පසුව ඇවිලුනු සටන, සමහර වාර්තාවන්ට අනුව, මිනිත්තු 25ක් තරම් දිගු කාලයක් පැවතුනි. පොලිස් නිලධාරින් හය දෙනෙක්, විනිසුරුවරුන් ප්‍රවාහනය කරමින් තිබූ බස් රථයේ රියදුරු සහ තවත් සිවිල් වැසියෙක් ඝාතනයට ලක් විය. අඩු ගනනේ ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කන්ඩායමේ ක්‍රීඩකයන් පස් දෙනෙක්, කන්ඩායමේ සහාය පුහුනුකරු සහ විනිසුරුවරයෙක් මෙන් ම පොලිස් භටයන් හය දෙනෙක් ද තුවාල ලැබූහ.

ප්‍රහාරකයන් සියලු දෙනා බේරී පලා ගියහ. අඟහරුවාදා සිද්ධිය සම්බන්ධයෙන් තමන් පුද්ගලයන් සිවු දෙනෙක් අත් අඩංගුවට ගෙන ඇති බව, පැය ගනනාවකට පසුව, පකිස්තාන බලධාරින් නිවේදනය කල නමුත්, සිවු දෙනාගෙන් කිසිවෙකු හෝ ප්‍රහාරයට සහභාගි වී ඇති ද යන වග හෝ නැතිනම් ඔවුන් එයට සම්බන්ධිත වන්නේ කෙසේ ද යන වග හෝ පිලිබඳ කිසිදු තොරතුරක් සම්පාදනය කර නැත.

මාරාන්තික හානි පහසුවෙන් ම දෙගුන හෝ තෙගුන විය හැකිව තිබුනු අඟහරුවාදා කොමාන්ඩෝ ප්‍රහාරය සම්බන්ධයෙන් කිසිදු කන්ඩායමක් මේ වන තෙක් වගකීම භාර ගෙන නැත. එහි පැහැදිලි එල්ලය වූයේ, හැකි උපරිම ජාත්‍යන්තර අවධානය ආකර්ෂනය කර ගැනීම -- ක්‍රිකට් වනාහි බොහෝ සෙයින් දකුනු ආසියාවේ වඩාත්ම ඉහල පෙලේ හා ජනප්‍රිය ක්‍රීඩාවයි -- සහ රටේ ප්‍රධාන නගර පවා ආරක්ෂිත කරගැනීමට පකිස්තාන බලධාරින්ගේ ඇති නොහැකියාව ප්‍රදර්ශනය කිරීමයි.

පසුගිය වසර එකහමාර මුලුල්ලේ පකිස්තානයේ විශාලතම නගරවල නැවතනැවතත් ත්‍රස්ත ප්‍රහාර එල්ල කෙරී ඇත. මෙම ප්‍රහාර සිදු කල පුද්ගලයන්ගෙන් කිසිවෙක් හෝ අත්අඩංගුවට ගෙන වරදකරුවන් කරනු තබා පැහැදිලිව හඳුනාගනු ලැබ හෝ නැත. 2007 ඔක්තෝබර් 19 දා උදෑසන, පකිස්තාන මහජන පක්ෂයේ (පීපීපී) ජීවිත කාලීන සභාපතිනි බෙනාසිර් භූතෝගේ රථ පෙරහැර කරච්චි නගරය හරහා ගමන් කරන විට එය සුනුවිසුනු කරමින් බෝම්බ ප්‍රහාරයක් එල්ල වූයේ මිනිසුන් 135කට වඩා මරාදමමිනි. ඉන් මාස දෙකකට පසුව, පකිස්තාන මිලිටරියේ මූලස්ථානය පිහිටි, ඉහලම මට්ටමකින් ආරක්ෂාව තරකර ඇති, නගරයක් වන රාවල්පින්ඩි මධ්‍යයේ දී එල්ල වූ බෝම්බ හා වෙඩි ප්‍රහාරයකින් භූතෝ ඝාතනය කෙරී තවත් 20ක් මරාදැමුනි. පසුගිය සැප්තැම්බරයේ දී පකිස්තාන අගනුවර වන ඉස්ලාමාබාද්හි ප්‍රමුඛතම හෝටලයට එල්ල වූ බෝම්බ ප්‍රහාරයකින් 54 දෙනෙක් ඝාතනය කෙරුනි.

පකිස්තානයේ හා දශක ගනනාවක් තිස්සේ එහි ප්‍රතිවාදියා වන ඉන්දියාවේ විවිධ රාජ්‍ය ක්‍රියාකාරීන් සහ පක්ෂ මැතම ජනඝාතනය පිලිබඳ පවත්නා මහජන වෛරය හා භීතිය සිය වාසියට යොදාගැනීමට උත්සාහ දරන තතු තුල, අඟහරුවාදා සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙස නිල දෝෂාරෝපනවල හා ඇඟිල්ල දිගු කිරීම්වල නව වටයක් ඇරඹී ඇත.

පකිස්තාන ජනාධිපති හා පීපීපී සභාපති අසිෆ් අලි සර්දාරිගේ සමීප සහායකයකු වන පංජාබ් ආන්ඩුකාර සල්මන් තසීර්, අඟහරුවාදා ප්‍රහාරය නොවැම්බර් අග ඉන්දියාවේ මුම්බායිහි එල්ල කෙරුනු ප්‍රහාරයට සමාන බව පවසා, එකම ආකාරයේ කොටස් විසින් එය සිදු කරනු ලැබ ඇතැයි ද යෝජනා කලේය.

"මෙය මුම්බායිවලට පහර දුන් ආකාරයට සමාන විධික්‍රම යොදාගත් එකම ආකාරයේ මිනිසුන් එල්ලකල ප්‍රහාරයක්" යයි තසීර් වාර්තාකරුවන්ට පැවසීය.

මරන 163කට තුඩු දුන් මුම්බායි ප්‍රහාරය, ආංශිකව පකිස්ථානයේ සිට සංවිධානය කල බවත් පකිස්තානයේ මිලිටරි-බුද්ධි යාන්ත්‍රනය සමග දිගු කාලයක් සමීප සබඳතා තිබූ ඉස්ලාම්වාදී සන්නද්ධ කන්ඩායමක් වන ලෂ්කාර්-ඉ-ටයිබි (එල්ඊටී) සංවිධානයේ නායකත්වයේ කොටස් එයට සම්බන්ධිත බවත්, වොෂිංටනයේ හා නව දිල්ලියේ දැඩි පීඩනය යටතේ, පසුගිය මාසයේ දී පකිස්තාන ආන්ඩුව පිලිගත්තේය. ඊට පෙර පවා, පකිස්තාන බලධාරින් එල්ඊටී මධ්‍යස්ථාන ගනනාවක් වසා දමා එහි නායකත්වයේ විශාල කොටසක් අත්අඩංගුවට ගෙන තිබුනි.

සර්දාරි සහ පකිස්තානයේ පීපීපී නායකත්වයෙන් යුක්ත ආන්ඩුව, ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද වාඩිලෑමට ඉස්ලාමාබාදය සපයන අඛන්ඩ බලගතු සහයෝගය ද පෙන්ටගනය හා පකිස්තාන මිලිටරිය අතර දශක ගනනාවක දීර්ඝ සන්ධානය පවත්වාගෙන යාම ද යුක්තියුක්ත කරනු වස් ඉස්ලාම්වාදී ත්‍රස්තවාදයේ තර්ජනය සහ පකිස්තානයේ දේශසීමා කලාපවල තලිබාන්-හිතැති කන්ඩායම්වල වැඩෙන බලය යොදාගෙන තිබේ. මෙම සන්ධානය ඉස්ලාමාබාද්හි දක්ෂිනාංශික මිලිටරි ආඥාදායකත්වයන් අනුප්‍රාප්තිකව බලය දරා සිටීමට අත්‍යවශ්‍ය පාදක කුලුනක් වී තිබේ.

ඊයේ ප්‍රහාරයේ මූලය ඉන්දියාව බවට පකිස්තාන ආන්ඩුවේ සිටින සෙසු කොටස් චෝදනා කරති.

"අපට ලැබී ඇති සාක්ෂ්‍ය මගින් පෙන්නුම් කෙරෙන්නේ මෙම ත්‍රස්තවාදීන් ඉන්දියාවේ සිට දේශසීමාව හරහා ඇතුලු වූ බව" යයි, පකිස්තානයේ නාවික කටයුතු පිලිබඳ රාජ්‍ය ඇමති හා පීපීපී මන්ත්‍රීවරයකු වන සර්දර් නබිල් අහමඩ් ගබොල් ජියෝ ටෙලිවිෂන් සේවයට පැවසීය." මේක පකිස්තානය ජාත්‍යන්තරව අපකීර්තියට පත්කරන්න කරපු කුමන්ත්‍රනයක්." මෙම ප්‍රහාරය මුම්බායි ප්‍රහාරයට පලිගැනීමක් යයි කියාපෑ ගබොල්" ඉන්දියාව පකිස්තානයට එරෙහිව විවෘතව යුද ප්‍රකාශ කිරීමක්" ලෙස එය නම් කලේය.

ප්‍රහාරයට ඉන්දියාවේ සම්බන්ධය බැහැර කල නොහැකි යයි ලාහෝර් කොමසාරිස් කුෂ්රෝ පර්වේස් සඳහන් කල අතර, පකිස්තානයේ අභ්‍යන්තර කටයුතු පිලිබඳ ඇමති රේහ්මන් මලික්" විදේශ හස්තයක්" සම්බන්ධවීමේ හැකියාව ගැන කතා කලේය. පකිස්තානයේ විශාලතම ඉස්ලාම් මූලධර්මවාදී පක්ෂය වන ජමාට්-ඉ-ඉස්ලාම් සංවිධානයේ ප්‍රධානි ක්වාසි හුසේන්, ප්‍රහාරය පිටුපසින් ඉන්දියානු රහස් ඔත්තු ඒජන්සි සිටින බවට චෝදනා කලේය.

ඒ අතරතුර, ඉන්දියානු දේශපාලන නායකයෝ, ජාත්‍යන්තර ත්‍රස්තවාදයේ මධ්‍යස්ථානය ලෙස පකිස්තානය පෙන්නුම් කිරීමේ සිය උද්ඝෝෂනය උත්සන්න කරනු වස් ලාහෝර් ප්‍රහාරය ඩැහැගෙන තිබේ. මෙම උද්ඝෝෂනයට ද්විත්ව අරමුනු තිබේ. එනම්, ඉන්දියානු පාලනය යටතේ පවතින කාශ්මීරය තුල සන්නද්ධ නැගිටීමට එය දෙන සියලු සහයෝගය නතර කරන ලෙස පකිස්තානයට බල කිරීම ද ඇෆ්ඝන් යුද්ධයේ දී පකිස්තානයේ භාන්ඩ හා සේවා සහ මිලිටරි සහාය මත වොෂිංටනයේ රදාපැවැත්ම, ඉන්දු-එක්සත් ජනපද" ගෝලීය, මූලෝපායික හවුල්" යයි කියනු ලබන සන්ධානය දූර්වල කිරීමට හේතු නොවන බවට සහතික කරගැනීම ද වේ.

ලාහෝර් ප්‍රහාරයෙන් පැය කිහිපයක් ඇතුලත, ඉන්දියානු විදේශ ඇමති ප්‍රනාබ් මුඛර්ජී, වාර්තාකරුවන් ඉදිරියේ පෙනී සිට," පකිස්තානයේ ත්‍රස්තවාදී යටිතල පහසුකම් . . . මුලුමනින්ම බිඳවිසුරුවා දැමිය යුතු" යයි ඉල්ලා සිටියේය. ස්වදේශ ඇමති පී. චිදම්බරම් දැවැන්ත ආරක්ෂක අසාර්ථකත්වය සම්බන්ධයෙන් පකිස්තාන බලධාරින්ට බැන වැදුනේය.

පකිස්තානයේ" ත්‍රස්තවාදී කඳවුරු" ඉවත් කරනු සඳහා මිලිටරි ක්‍රියාමාර්ගවලට යාමට ඉන්දියාවට සිදු විය හැකි බවට මුඛර්ජී සහ චිදම්බරම් නැවතනැවතත් යෝජනා කර තිබේ.

ඉන්දියාවේ එක්සත් ප්‍රගතිශීලී සන්ධාන ආන්ඩුවේ අධිපති හවුල්කරු වන කොංග්‍රස් පක්ෂයේ ප්‍රකාශකයෙක් වඩාත් ප්‍රකෝපකාරී අදහස් දැක්වීමක් කලේය. ලාහෝර් ප්‍රහාරය "1979 සිට 2009 දක්වා පකිස්තානය ක්‍රියාත්මක කර ඇති පිලිවෙත්වල ප්‍රතිඵලය" යයි මනිෂ් තෙවාරි පැවසුවේ, සෝවියට් සංගමය අස්ථායි කිරීමේ සිය ප්‍රයත්නයන්ගේ කොටසක් ලෙස ඉස්ලාම් මූලධර්වාදී සන්නද්ධ කන්ඩායම්වලට අනුග්‍රහය දක්වනු පිනිස පකිස්තාන රාජ්‍යය පොලඹවාලූයේ එක්සත් ජනපදය ය යන කරුන පහසුවෙන් ම නොතකා හරිමිනි.

"පකිස්තානයේ යමක් සිදු වන්නේ නම්" "ඒ සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ පකිස්තානය පමනි" යයි තෙවාරි පැවසීය.

ඉන්දියාවේ යුදවාදී හින්දු දක්ෂිනාංශය, පකිස්තානය "ත්‍රස්තවාදී රාජ්‍යයක්" ලෙස හංවඩු ගැසීමේ බලාපොරොත්තුව දිගු කලක් තිස්සේ දරාගෙන ඒ සඳහා බලකර ද තිබේ. තෙවාරි මේ ඉල්ලීම මතු කලේ නැති වුවත් ඔහු යොමු වූයේ ඒ දිශාවටයඃ" පකිස්තානය න්‍යෂ්ටික ආයුධ සහිත රාජ්‍යයක්. එය අසාර්ථක රාජ්‍යයක තත්වයේ සිට දකුනු ආසියාවේ සෝමාලියාව බවට පත්වෙමින් සිටින ආකාරය ගැන ජාත්‍යන්තර ප්‍රජාවේ කනස්සල්ල මතුවීම අවශ්‍යයි. . . පකිස්තානය කාල බෝම්බයක් බවට පත්වෙනවා."

කාශ්මීරයේ සන්නද්ධ නැගිටීම සහ ඉන්දියාව තුල වඩා මැත ප්‍රපංචයක් වන ඉස්ලාම් ත්‍රස්තවාදය සරලවම හා මුලුමනින් ම පකිස්තානයේ ඇගිලිගැසීම්වල හා දුෂ්ටත්වයේ නිෂ්පාදිතයක් බව පෙන්නුම් කිරීමට ඉන්දියානු ප්‍රභූව දිගු කලක් තිස්සේ උත්සාහ කර ඇත. යථා වසයෙන් ගත් කල, එම ප්‍රපංච දෙකට ම, 1947 දකුනු ආසියාවේ ප්‍රතිගාමී වාර්ගික බෙදීම දක්වා අතීතයට දිවෙන, දිගු කාලීන දේශීය මූලයන් පවතී. එපමනක් නොව, ඒවායේ නැගීම අවබෝධ කරගත හැක්කේ, ඉන්දියානු ප්‍රභූවේ වඩවඩා විවෘත හින්දු ස්වෝත්තමවාදයේ ද සුලුතර විරෝධී ජනඝාතනවලට ලැජ්ජා විරහිත ලෙස සහයෝගය දීමේ ද සන්දර්භය තුල පමනි.

ඉන්දියාවේ ජාතික මැතිවරන අප්‍රේල් 16 දා සිට මැයි 13 දා දක්වා අදියර පහකින් පැවැත්වීමට නියමිතව තිබිය දී, තමන් ත්‍රස්තවාදය සම්බන්ධයෙන් "මෘදු" ආකල්පයක් දරන බවට හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂය (බීජේපී) ගෙන යන ප්‍රතිගාමී හා වාර්ගිකව ආරෝපිත කියාපෑම්වලට ප්‍රතිමූඛ කිරීමේ බලගතු අවශ්‍යතාවයෙන් කොංග්‍රස් පක්ෂය පෙලෙයි. කොංග්‍රස් පක්ෂයේ අභිප්‍රාය වන්නේ, පකිස්තානය "එයට නියමිත ස්ථානයේ" තැබීමට තමන්ට හැකි බවත් "ත්‍රස්තවාදය පරාජය කිරීම" උදෙසා මූලික සිවිල් අයිතීන් පාගාදැමීම සම්බන්ධයෙන් තමන් කම්පා නොවන බවත් පෙන්නුම් කිරීම මගින් බීජේපීයේ කියාපෑම්වලට මුහුන දීමයි.

ශ්‍රී ලංකා ක්‍රිකට් කන්ඩායම ත්‍රස්තවාදීන්ගේ ඉලක්කය ලෙස පෙනී ගියත්, ඊයේ සිද්ධීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආන්ඩුව දැක්වූ ප්‍රතිචාරය මේ වන තෙක් සාපේක්ෂව අඩු මට්ටමේ එකක් වී තිබේ. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය ප්‍රහාරය පිටුපස සිටිය හැකි බවට සමහර පුවත්පත් යෝජනා කර ඇති මුත් කොලඹ ආන්ඩුව එවන් චෝදනාවක් එල්ල කර නැත.

පසුගිය වසර මුලුල්ලේ, ශ්‍රී ලංකා ආන්ඩුව තමන් දිවයිනේ 25-අවුරුදු සිවිල් යුද්ධයට සාකච්ඡාමය විසඳුමක් සොයන බවට මොන යම් හෝ මවාපෙන්වීමක් වත් අතහැර දමා එල්ටීටීඊයට එරෙහිව එය සමූලඝාතනය කිරීමේ දන්ඩන යුද්ධයක් ගෙනගොස් තිබේ. එය වනාහි දැන් සඵල ලෙස අවසන් වී ඇතැයි කියාපාන යුද්ධයකි.

ලාහෝර් ප්‍රහාරය, අර්බුදයෙන් වෙලී ඇති භේදයන්ගෙන් ඉරිතලා ඇති පකිස්තාන ආන්ඩුව හා රාජ්‍ය යන්ත්‍රනය තව දුරටත් අස්ථායි කිරීමට පමනක් තුඩු දිය හැකිය.

සම්ප්‍රදායිකව ස්වතන්ත්‍ර තත්වයක් භුක්ති විඳින මධ්‍යම ආන්ඩුවෙන් පාලනය කෙරෙන ගෝත්‍රික ප්‍රදේශය තුල තලිබාන්-හිතැති එක්සත් ජනපද විරෝධී සන්නද්ධ නැගිටීම සඳහා පවතින සියලු සහයෝගය අතුගාදැමීමේ සිය ප්‍රයත්නයන් පකිස්තානය දැවැන්ත ලෙස උත්සන්න කල යුතු යයි ඔබාමා පාලනාධිකාරය ඉල්ලා සිටී. එහෙත් මිලිටරිය යොදගෙන ඇති මෘග විධික්‍රම ප්‍රාදේශීය ජනතාවගෙන් විශාල කොටසක් දැනටමත් විරසක කොට ඇති අතර වොෂිංටනය සිය කොල්ලකාරී විදේශ පිලිවෙතෙහි අවියක් ලෙස පකිස්තානය යොදා ගැනීම ද එය පකිස්තාන මිලිටරියට අනුග්‍රහ දැක්වීම ද සම්බන්ධයෙන් පකිස්තාන ජනතාව බොහෝ සෙයින් කෝපයට පත්ව තිබේ.

සාකච්ඡා කෙරුනු නය පැකේජය වන ඩොලර් බිලියන 7.6 ඉක්මවා සැලකිය යුතු ඉහල අගයක් ගන්නා තවත් නය ආධාර මුදලක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඉල්ලා සිටීමට පකිස්තානයට බල කෙරී ඇත.

පසුගිය සතියේ දී, පීපීපී සහ රටේ දෙවන විශාලතම පක්ෂය වන පකිස්තාන මුස්ලිම් ලීගය (නවාෂ්) -- පීඑම්එල් (එන්) -- අතර දිගු කලක් තිස්සේ කැකෑරෙන ප්‍රතිවාදිත්වය පුපුරා යන තත්වයකට සේන්දු වූයේ, සර්දාරි සහ පීපීපී, පකිස්තානයේ විශාලතම පලාත වන පංජාබ්හි පීඑම්එල් (එන්) ආන්ඩුව ඉවත් කරනු පිනිස පැහැදිලිවම ප්‍රජාතන්ත්‍ර විරෝධී වූ උසාවි තීන්දුවක් ඩැගැගත් විටය.

බුෂ්ගේ පිටුබලය ලද හිටපු ආඥාදායක ජෙනරාල් පර්වේස් මුෂාරෆ් විසින් ඉවත් කරන ලද විනිසුරුවරුන් යලි අධිකරන විනිශ්චය ආසනවල පිහිටුවීමට ආන්ඩුව අපොහොසත් වීම සම්බන්ධයෙන් විරෝධය පාමින් මේ මාසයේ අග භාගයේ දී රටේ පාර්ලිමේන්තුව අභියස වාඩිලාගැනීමක් සංවිධානය කිරීමෙන් නීතිඥයන් වලකන බවට සර්දාරි සහ පීපීපී නායකත්වයෙන් යුක්ත ආන්ඩුව ප්‍රතිඥා දී තිබේ.

මේ සතිය මුල දී, ජනාධිපති සර්දාරි, ඉක්මන් "විනිශ්චයන්" නිකුත් කරනු වස් ජංගම උසාවි පිහිටුවීමේ විධායක ආඥාවක් නිකුත් කලේය. මෙම ආඥාව පුලුල් ලෙස දකිනු ලබන්නේ, නීතිඥයන්ගේ ව්‍යාපාරය ඇතුලු, ආන්ඩු විරෝධී ව්‍යාපාර තලාදමනු වස් මහා පරිමාන සිරගත කිරීම සඳහා සූදානම් වීමක් ලෙසය. මෙවන් අධිකරන තන්ත්‍රයක් අවසන් වතාවට පනවන ලද්දේ 1919 දී, එනම් බ්‍රිතාන්‍ය විජිත පාලන බලධාරීන් ලාහෝර්හි දැවැන්ත මහජන ප්‍රතිරෝධය තලාදැමීමට උත්සාහ කල අවස්ථාවේ බව විවේචකයෝ සටහන් කරගනිති.